සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 2.1.1. ස්වභාවික හා නිර්මිත වස්තූන් නිරීක්ෂණය කර සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි**

1. ඉගෙනුම් ආධාරක





2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- පහත දී ඇති ද්‍රව්‍ය සම්පිණ්ඩන රූප සටහන් හොඳින් නිරීක්ෂණය කරන්න
- ඇඳීමට ප්‍රථම මෙම ද්‍රව්‍යන්හි ඇති සරල හැඩ පිළිබඳ අවබෝධ කරගන්න.
- ද්‍රව්‍ය බලා ඇඳීමේදී පර්යාවලෝකය, එළිය, අඳුර, ගැඹුර හා සමබරතාව යන සිද්ධාන්ත ඉතා වැදගත් වේ. **(පර්යාවලෝකය - ළඟ ඇති වස්තූන් විශාලවත් දුර ඇති වස්තූන් ඈතට යන විට කුඩාවටත් පෙනීම.)**

| |
|---|
| **ක්‍රියාකාරකම** |
| **සනක හැඩැති වස්තුවක්, බාල්දියක්, වීදුරු බෝතලයක්, තැඹිලි ගෙඩියක් සම්පිණ්ඩනය කර වර්ණ කිරීම** |

3. ඇගයීම

- ඉහත ඔබට දී ඇති ආදර්ශ රූප සටහන් ආශ්‍රයෙන් ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- එක් එක් ද්‍රව්‍ය වෙන වෙනම දළ සටහන් අඳින්න. ඒ සඳහා ඔබ ඉගෙන ඇති සරල රේඛා අභ්‍යාස උපයෝගී කරගන්න.
- ඔබ වෙන වෙනම ඇඳගත් ද්‍රව්‍යයන් එක් තලයක සම්පිණ්ඩනය කරන්න.
- පර්යාලෝක ලක්ෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න.
- පසුව පැන්සල් භාවිතයෙන් රේඛාවෙන් එළිය අඳුර දක්වන්න.